**ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 247 -ශ්‍රී ලංකා රේගුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම්, අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 දෙසැම්බර් 05 දින ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම්, අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

ශ්‍රී ලංකා රේගුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 2,085.45 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 2,046.94 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා රේගුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 38.51 ක් හෙවත් සියයට 1.85 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 1,870.54 | 1,865.93 | 4.61 | 0.25 |
| මූලධන | 214.91 | 181.01 | 33.90 | 15.77 |
| **එකතුව** | **2,085.45** | **2,046.94** | **38. 51** | **1.85** |

**2.2** **ආදායම් ගිණුම්**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

ශ්‍රී ලංකා රේගුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේත 16 ක් සඳහා එකතුව රු.මිලියන 615,555 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 615,888 ක ආදායම් රැස්කර තිබුණි. එම රැස්කරගත් ආදායම ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 100.05 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම/ (ඌනතාවය) |
|---|---|---|---|---|
| | සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන | තථ්‍ය ආදායම රු.මිලියන | ඉක්මවීම/ (ඌනතාවය) රු.මිලියන | ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
| 10.01.01.00 | 92,000.00 | 108,115.91 | 16,115.91 | 17.52 |
| 10.01.02.00 | 60.00 | 33.38 | (26.62) | ( 45.00) |
| 10.01.04.00 | 55,000.00 | 56,733.27 | 1,733.27 | 3.15 |
| 10.01.05.01 | 42,000.00 | 42,467.40 | 467.40 | 1.11 |
| 10.01.05.02 | 3,400.00 | 2,713.28 | (686.72) | (20.21) |
| 10.01.06.00 | - | - | - | - |
| 10.01.07.00 | - | 0.29 | 0.29 | - |
| 10.01.08.00 | 56,000.00 | 52,275.58 | (3,724.42) | (6.65) |
| 10.01.99.00 | - | - | - | - |
| 10.02.05.01 | 80,000.00 | 79,980.67 | (19.33) | ( 0.02) |
| 10.02.05.02 | - | - | - | - |
| 10.02.05.03 | 34,000.00 | 45,091.92 | 11,091.92 | 32.62 |
| 10.02.05.04 | 240,000.00 | 223,413.69 | (16,586.31) | (6.92) |
| 10.02.05.99 | 10,000.00 | 3,812.13 | (6,187.87) | (61.88) |
| 20.03.02.17 | 100.00 | 121.64 | 21.64 | 21.64 |
| 20.03.03.01 | 1,400.00 | 1,129.22 | (270.78) | (62.36) |
| **එකතුව** | **613,960.00** | **615,888.38** | **1,928.38** | **0.31** |

**2.3.** **අත්තිකාරම් ගිණුම්**

**2.3.1** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ශ්‍රී ලංකා රේගුවට අදාළ විෂය අංක 24701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 49.00 | 25.19 | 40.00 | 48.43 | 310.00 | 201.79 |

### 2.3.2 අත්අඩංගුවට ගත් හා රාජසන්තක කළ බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ශ්‍රී ලංකා රේගුවට අදාළ අත්අඩංගුවට ගත් හා රාජසන්තක කළ බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය සීමාව | අවම සීමාව | තථ්‍ය සීමාව | උපරිම සීමාව | තථ්‍ය සීමාව |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 11.00 | 4.59 | 2.00 | 2.56 | 29.00 | 26.65 |

## 2.4 අග්‍රිම ගිණුම

ශ්‍රී ලංකා රේගුවේ අංක 7002/0000/00/0071/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 76.83 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම

ශ්‍රී ලංකා රේගුව යටතේ වන තැන්පත් ගිණුම් 05 ක 2015 දෙසැම්බර් 31 දිනට පැවැති ශේෂවල එකතුව රු.මිලියන 16,906.77 ක් විය. විස්තර පහත දැක්වේ.

| ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0015/0127/000 | 9,977.35 |
| 6000/0000/00/0001/0035/000 | 4.06 |
| 6000/0000/00/0006/0032/000 | 1,656.69 |
| 6000/0000/00/0006/0061/000 | 4,640.25 |
| 6000/0000/00/0006/0062/000 | 628.42 |
| **එකතුව** | **16,906.77** |

## 2.6 විගණන නිරීක්ෂණය

-----------------------

ශ්‍රී ලංකා රේගුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම්, අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-------------------------------------------

ශ්‍රී ලංකා රේගුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසි | නිරීක්ෂණය |
|---|---|---|---|
| (i) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (ii) | විදුලි උපකරණ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) | පවත්වා නොතිබුණි |
| (iii) | රාජකාරි දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845 (1) | පවත්වා නොතිබුණි. |
| (iv) | විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (v) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (vi) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

## 3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර තිබුණු ඉඩම් 21 ක අයිතිය තහවුරු කිරීමේ ලියවිලි ශ්‍රී ලංකා රේගුව විසින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම

ශ්‍රී ලංකා රේගුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 23 කට 2016 ජූනි 30 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.මිලියන 43,305.62 ක් වී තිබුණි.

## 3.4 විසර්ජන ගිණුම

### 3.4.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 247-01-01-2401 දරන පුහුණු හා හැකියා වර්ධනය වැය විෂය යටතේ රු.මිලියන 2.00 ක ප්‍රතිපාදන වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සලසා තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු. මිලියන 1.24 ක් 2015 දෙසැම්බර් 31 දින වෙනත් ප්‍රාග්ධන වැය විෂයයන්ට මාරු කර තිබුණි. පුහුණු හා හැකියා වර්ධනය සඳහා වූ අවශ්‍යාව තිබුණු රු.මිලියන 2.44 ක් කළමනාකරණ වන්දි අරමුදලින් වැය කර තිබුණි. මේ අනුව පුහුණු හා හැකියා වර්ධනය වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් අදාළ අරමුණු ඉටු කර ගැනීමට උපයෝජනය නොකර, අවිධිමත් ලෙස වෙනත් වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන මාරු කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මූලධන වැය විෂයයන් 04 ක් සඳහා එකතුව රු.මිලියන 36.81 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදන ප්‍රමාණය රු.මිලියන 13.02 කින් ඉක්මවා රු.මිලියන 49.83 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම වැය විෂයයන් 04 හි ඇති වූ අධිවැය අවිධිමත් ලෙස වලක්වා ගැනීම සඳහා කළමනාකරණ වන්දි අරමුදලින් රු.මිලියන 15.48 ක් වැය කර තිබුණි. වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සලසා එම ප්‍රතිපාදන සීමාව තුළ අදාළ අරමුණු ඉටු කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය කිරීම කළ යුතු වුවත්, ඒ අනුව ශ්‍රී ලංකා රේගුව කටයුතු කර නොතිබුණි.

## 3.5 අග්‍රිම ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අග්‍රිම ගිණුමේ පැවැති රු.මිලියන 2.00 ක ශේෂයක් 2016 ජූලි 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණු අතර එම ශේෂය 2008 වර්ෂයේ සිට පැවැත එමින් තිබුණි.

(ආ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 17 කට අදාළව ලබාදී තිබුණු එකතුව රු.1,093,497 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාස 01 ක සිට මාස 10 ක් දක්වා පරාසයක කාල පමාවකින් පසුව නිරවුල් කර තිබුණි.

(ඇ) අත්තිකාරම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

**3.6 පොදු තැන්පත් ගිණුම්**

ශ්‍රී ලංකා රේගුවේ පැවැති තැන්පත් ගිණුම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) අංක 6000/0000/00/0015/0127/000 දරන විවිධ තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 ජුලි 12 දිනැති අංක 209/2010 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4.3(1) ඡේදය ප්‍රකාරව තැන්පතු ලෙජරවල 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ දක්වා නොතිබුණි. එම තැන්පතු ලෙජර විධිමත් පරිදි යාවත්කාලීන කර නොතිබුණි.

(ii) භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අතර 2014 දෙසැම්බර් 31 දිනට පැවති රු.45,883,133 ක් වූ වෙනස සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කර සසඳා නොතිබුණි.

(iii) විවිධ තැන්පතු ලැබීම්වලට අදාළව උපයෝගී ලෙජරයන්හි දක්වා තිබුණු කේවල ශේෂ එකතුව හා ගිණුමේ දක්වා තිබුණු ශේෂ එකතුව අතර රු.140,839,576 ක වෙනසක් අනාවරණය වී තිබුණත්, එම වෙනස සසඳා නිවැරදි කර නොතිබුණි.

(iv) විවිධ තැන්පතු ගිණුම සඳහා වූ ඇතැම් විවිධ තැන්පතු ගෙවීම්වලට අදාලව උපයෝගී ලෙජරයන්හි දක්වා තිබුණු කේවල ශේෂ එකතුව හා ගිණුමේ දක්වා තිබුණු ශේෂ එකතුව අතර රු.13,361,163 ක වෙනසක් අනාවරණය වී තිබුණත්, එම වෙනස සසඳා නිවැරදි කර නොතිබුණි.

**(ආ) අංක 6000/0000/00/0001/0035/000 දරන ගුවන් මගීන් රැගෙන යන භාණ්ඩ සඳහා වන තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 02 ක් ඉක්මවූ එකතුව රු.467,249 ක් වූ තැන්පතු 29 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ තැන්පත් ගිණුමේ රු.1,640,122 ක ලැබීම් ගිණුම් ගත කර නොතිබුණි.

(iii) ඉහත තැන්පත් ශේෂ අතරින් 2015 සැප්තැම්බර් 01 දින, 2015 දෙසැම්බර් 20 දින හා 2015 දෙසැම්බර් 21 දින යන දිනයන්හි නිදහස් කර තිබුණු එකතුව රු.1,610,700 ක් වූ තැන්පතු සම්බන්ධ තොරතුරු තැන්පත් ලෙජරයේ සටහන් කර නොතිබුණි. මේ නිසා ඉදිරිපත් කරන ලද තැන්පත් ගිණුමේ රු.1,610,700 ක තැන්පතු ආපසු ගෙවීම් අඩුවෙන් දක්වා තිබුණි.

(iv) තැන්පතු ලෙජර විධිමත් පරිදි යාවත්කාලීන කර නොතිබුණි.

**3.7 ආදායම් ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

දෙපාර්තමේන්තු ප්‍රධානියාට ආදායම් ගණන්දීමේ නිලධාරී වශයෙන් ආදායම් සංකේත 16 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීම යනාදී කාර්යභාරයන් පැවැරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මත්පැන් හා දුම්කොල හැර අනිකුත් භාණ්ඩ මත පනවා තිබුණු නිෂ්පාදන බදු සම්බන්ධයෙන්, නිෂ්පාදන බදු පනත ක්‍රියාත්මක කිරීමට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවකාශය ලැබෙන පරිදි 1990 අංක 40 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කර ඒකාබද්ධ නිෂ්පාදන බදු විශේෂ විධිවිධාන පනතක් සකස් කිරීමට 1993 මාර්තු 17 දිනැති අංක 93/360/060 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව යටතේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිර්දේශ කර තිබුණි. නමුත් 2015 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ සංශෝධනයන් සිදු කර පනතක් කෙටුම්පත් කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේදී අහෝසි කර තිබූ ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදුවල 2015 ජනවාරි 01 දිනට අයවිය යුතුව පැවති රු.මිලියන 34.28 ක්වූ හිඟ බදුවලින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේදී රැස් කර ගෙන නොතිබුණි. එහෙත් ආනයන සෙස් බදු ආදායම් සංකේතය යටතේ රැස් කළ රු.286,733 ක් ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු ආදායම් සංකේතය යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයෙහි ආදායම් සංකේත 08 කට අදාළව ආදායම් ගිණුම්වල මුදලින් ආපසු ගෙවීම් ලෙස එකතුව රු.මිලියන 36,434.69 ක් දක්වා තිබුණි. එම වටිනාකමෙන් රු.මිලියන 36,186.53 ක් හෙවත් සියයට 99 ක්ම වැරදි නිවැරදි කිරීම්වලට අදාල හර කිරීම් ඇතුළත් කර තිබුණි.

(ඈ) අංක 10.01.01.00 හා 20.03.03.01 දරන ආදායම් සංකේත සඳහා පිළිවෙලින් රු.9,215,001,221 ක හා රු.13,751 ක වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2015 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් වාර්තා අනුව අයවිය යුතු මුළු හිඟ බදු ආදායම රු. මිලියන 19,493.54 ක් වූ අතර එය සමස්ථ හිඟ බදු ආදායමින් සියයට 59 ක ප්‍රමාණය 2014 වර්ෂයට පෙර වර්ෂවලට අදාළ හිඟහිටි බදු ආදායම් වී තිබුණි. එසේම 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ හිඟ බදු ආදායම රු.මිලියන 3,466.70 කින් හෙවත් සියයට 21.62 කින් වැඩිවී තිබුණි.

(ඊ) 2015 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආනයන බදු වටිනාකම රු.මිලියන 7,468.90 ක් වී තිබුණි. එය සමස්ථ හිඟහිටි බදු ආදායමෙන් සියයට 38.31 ක ඉහළම අගය නියෝජනය කර තිබුණි. හිඟහිටි ආනයන බදු වටිනාකම 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී රු.මිලියන 1,386.56 කින් හෙවත් සියයට 22.79 කින් වැඩි වී තිබුණි. එසේම රු.මිලියන 5,921.66 ක් හෙවත් සියයට 79.28 ක් 2006 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළ හිඟ හිටි බදු ආදායම් වී තිබුණි.

(උ) 2015 දෙසැම්බර් 31 දින වන විට වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු ආදායමෙන් රු.මිලියන 3,118.98 ක ආදායම් හිඟහිට තිබුණි. එය සමස්ථ හිඟහිටි ආදායමෙන් සියයට 16 ක ප්‍රමාණයක් වී තිබුණි. එම හිඟහිටි ආදාමෙන් සියයට 86.08 ක් හෙවත් රු.මිලියන 2,684.77 ක් 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි. එම හිඟ හිටි ආදායම් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ශ්‍රී ලංකා රේගුව විසින් ගෙන නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආනයන සෙස් බදු වශයෙන් රු.මිලියන 1,604.19 ක ආදායම් හිඟහිටව පැවැතුණි. එය සමස්ථ හිඟහිටි ආදායමෙන් සියයට 8.23 ක් වී තිබුණි. 2006 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව රු.මිලියන 1,542.31ක ආදායමක් හිඟහිටව පැවැති අතර එය සමස්ථ හිඟ ආනයන සෙස් බදු ආදායමින් සියයට 96.14 ක් වී තිබුණි. අදාළ හිඟහිටි ආදායම් අයකර ගැනීම සඳහා නිරන්තර සිහිකැඳවීම් යවා තිබුණු බව විගණනය වෙත දන්වා තිබුණත්, එම හිඟහිටි ආදායම් 2016 අප්‍රේල් 30 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(එ) 2015 ජනවාරි 01 දිනට විශේෂ වෙළඳ භාණ්ඩ බදු ආදායම් වශයෙන් රු.මිලියන 15.15 ක් හිඟහිටි ආදායම් ලෙස පැවතුණි. 2015 දෙසැම්බර් 31 දිනට එය රු.මිලියන 3,598.08 ක් දක්වා රු. මිලියන 3,582.93 ක් හෙවත් සියයට 23649 ක ප්‍රමාණාත්මක ප්‍රමාණයකින් වැඩිවීමක් වී තිබුණි. මේ සඳහා 2015 වර්ෂය තුළ රාජ්‍ය ආයතනයක් විසින් ආනයනය කළ සහල් තොගවලට අදාළ හිඟහිටව පැවති විශේෂ වෙළඳ භාණ්ඩ බදු ආදායම බලපා තිබුණි. එම රාජ්‍ය ආයතනය විසින් 2015 දෙසැම්බර් 31 දින වන විට විවිධ බදු වර්ග යටතේ පියවිය යුතුව පැවති හිඟහිටි බදු එකතුව රු.මිලියන 718.12 ක් වී තිබුණු අතර ආනයනය කර තිබූ සහල් තොගවලින් කොටසක් වෙළඳපලට නිකුත් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන තිබුණු බව විගණනයේදී තහවුරු වී නොතිබුණි. ඇතැම් සහල් තොග යල්පැන තිබීම, සත්ව ආහාර සඳහා නිකුත් කර තිබීම හා විනාශ වී තිබුණි. එම නිසා එම රාජ්‍ය ආයතනය වෙතින් ලැබිය යුතුව පැවති රු.මිලියන 3,582.93 ක හිඟහිටි විශේෂ වෙළඳ භාණ්ඩ බදු ආදායම අයකර ගැනීම අවිනිශ්චිතව පැවතුණි.

(ඒ) මත්පැන් නිෂ්පාදන බදු ආදායම් වශයෙන් 2015 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 89.26 ක ආදායම් හිඟහිටව පැවතුණි. අදාළ සමාගම විසින් ගෙවීම් පැහැර හැරීම නිසා එම හිඟහිටි ශේෂය 2001 වර්ෂයේ සිට පැවැත එමින් තිබුණි. හිඟහිටි ආදායම අයකර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් එම සමාගමට එරෙහිව නඩු පවරා තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම හිඟහිටි ආදායම් අයකර ගැනීමට ශ්‍රී ලංකා රේගුව අපොහොසත් වී තිබුණි.

(ඔ) 2015 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟහිටි නිෂ්පාදන බදු ආදායමෙන් රු.මිලියන 1,084.65 ක් හෙවත් සියයට 5.56 ක මෝටර් වාහන නිෂ්පාදන බදු ආදායම් හිඟ හිට තිබුණි. බදු අයකිරීම කල් දැමීමේ පදනම මත මහා භාණ්ඩාගාරයේ අනුමැතිය මත රාජ්‍ය ආයතනවලට වාහන මුදා හැරීම නිසා මෙසේ මෝටර් වාහන නිෂ්පාදන බදු තවදුරටත් හිඟහිට පැවැත එමින් තිබුණි.

(ඕ) අනෙකුත් නිෂ්පාදන බදු ආදායම් වශයෙන් 2006 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.මිලියන 6.70 ක ආදායම් හිඟහිටව පැවති අතර එය සමස්ථ හිඟහිටි අනෙකුත් නිෂ්පාදන බදු ආදායමින් සියයට 93.94 ක් ප්‍රමාණයක් වී තිබුණි. එම හිඟහිටි ආදායම අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු ආරම්භ කර තිබුණත් එම හිඟහිටි ආදායම් අයකර ගැනීම දුර්වල මට්ටමක පැවතුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ ආදායම් සංකේත 03 කට අදාළව විගණනයට ඉදිරිපත් කර තිබුණු ආදායම් ගිණුම්වල සඳහන් කර තිබුණු වටිනාකම් ආදායම් ලෙජරයේ සඳහන් වටිනාකම් සමඟ වෙනස්වීම් පැවතුණි. නමුත් ආදායම් ගණන්දීමේ නිලධාරී විසින් එම වටිනාකම් සසඳා ඇති බව සහතික කර තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේ ඇහළුම් සඳහා දේශිය විකුණුම් මත ගාස්තු ආදායමෙහි සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 100 ක් වශයෙන් දක්වා තිබුණත්, ආදායම් ගිණුමේ එය රු.මිලියන 95 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.මිලියන 5 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ජ) සමාලෝචිත වර්ෂයේ දඩ මුදල් හා රාජසන්තක කිරීම් ආදායමෙහි සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 1,400 ක් වුවත්, ආදායම් ගිණුමේ එය රු.මිලියන 3,000 ක් ලෙස දක්වා තිබුණි.

(ට) 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව හිඟ ආදායම් වාර්තා එළඹෙන මාසය ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ශ්‍රී ලංකා රේගුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට අදාළ හිඟ ආදායම් වාර්තා මාස 02 ක පමණ ප්‍රමාදයකින් පසුව 2016 මාර්තු 29 දින ඉදිරිපත් කර තිබුණි.

(ඩ) 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය 04(අ) සිට (ඉ) දක්වා ඡේද ප්‍රකාරව මාසික ගිණුම් සාරාංශ සමඟ එකඟ වන පරිදි, දෙපාර්තමේන්තුවේ ආදායම් ලෙජරය පවත්වා නොතිබුණි.

**3.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-------------------------------------------------------------------

විෂය අංක 24701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දින වන විට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 201.73 ක් වූ අතර, එම හිඟ හිටි ණය ශේෂ 1992 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ ශේෂය අතර රු.63,009 ක් වූ වෙනසක් අනාවරණය වි තිබුණත්, එම වෙනස සසඳා නිවැරදි කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1994 අගෝස්තු 18 දිනැති අංක 96 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 ඡේදය පරිදි ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ පිළිබඳ උපලේඛනයේ ස්ථාන මාරුවීම් ලබා ගිය දිනය හා ස්ථානය සඳහන් කර නොතිබුණි.

**3.9 අත් අඩංගුවට ගන්නා ලද හා රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම**

-----------------------------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් තත්ත්වාගණනය කරන ලද විගණන මතය නිකුත් කර තිබුණි.

(ආ) අත්තිකාරම් ගිණුමේ අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.26,635,510 ක් වූ අතර, එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ඇ) වියදම් සඳහා අත්තිකාරම් ලබාගත් යම් සිද්ධියක් පිළිබඳව විමර්ශන කටයුතු කරගෙන යාමේදී එම සිද්ධියෙහි රේගුවේ වැරදි නැති බව නිරීක්ෂණය වී තිබුණි. ඒ අනුව එකී සිද්ධියට අදාළ රේගුවේ විමර්ශන කටයුතු නවතා තිබුණි. නමුත් එම විමර්ශනය සඳහා ලබාගත් අත්තිකාරම් ආවරණය කර ගැනීමේ ක්‍රමවේදයක් නොතිබුණි.

(ඇ) වාර්තා හා ලේඛන විධිමත් පරිදි පවත්වා නොතිබිම නිසා අධීක්ෂණය ප්‍රමාණවත් පරිදි සිදු කර තිබුණු බව නිරීක්ෂණය වි නොතිබුණි.

**3.10 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

-----------------------------------------

**3.10.1 විගණන හා කළමනාකරණ කමිටුව**

-----------------------------------------

විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට එක් වරක් හෝ රැස්විය යුතු වුවත්, 2015 වර්ෂයේදී කමිටුවේ රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි.

**3.10.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

**--------------------------------**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.11 වත්කම් කළමනාකරණය**

**---------------------------**

ශ්‍රී ලංකා රේගුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ඇමෙරිකානු ඩොලර් 15,600,000 ක මුදලක් වැයකර මිලදීගෙන තිබූ ස්කෑන් යන්ත්‍ර 4 න් 2 ක් පමණක් 2015 වර්ෂයේදී ක්‍රියාකාරීව පැවති අතර සමාලෝචිත වර්ෂය තුලදී යන්ත්‍ර සේවා කිරීම සඳහා රු.47,222,100 ක මුදලක්ද අළුත්වැඩියා සඳහා රු.3,071,528 ක මුදලක්ද වැයකර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී නිදහස් කරන ලද බහාළුම් අතරින් 10,737 ක් හෙවත් සියයට 3.25 ක් වන සුළු බහාළුම් සංඛ්‍යාවක් පමණක් ස්කෑන් පරීක්ෂාවට භාජනය කර තිබුණු අතර ඒ අනුව එක් බහාළුමක් පරීක්ෂා කිරීමේ පිරිවැය රු.4,684 කට ආසන්න බව නිරීක්ෂණය විය. ඉතා විශාල මූලික පිරිවැයක් වාර්ෂිකව සිදු කරන විශාල නඩත්තු හා අළුත්වැඩියා වියදම් සිදුකර ස්කෑන් යන්ත්‍ර ඌන උපයෝජිත තත්ත්වයේ පැවැති බවත්, වැඩි බහාළුම් සංඛ්‍යාවක් ස්කෑන් පරීක්ෂාවකට භාජනය කිරීමේ අවශ්‍යතාවය පවත්නා බවත් නිරීක්ෂණය විය.

(ii) ශ්‍රී ලංකා රේගුව විසින් රු.859,500 ක් වැයකර මිලදී ගෙන තිබුණු ඇඟිලි සළකුණු යන්ත්‍ර 07 ක් 2016 අප්‍රේල් 30 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. රේගු නිලධාරීන් විසින් ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතය ප්‍රතික්ෂේප කිරීම හා නව රේගු ගොඩනැගිල්ලේ කටයුතු ආරම්භ කිරීමෙන් පසු මෙම යන්ත්‍ර ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබීම නිසා මෙම යන්ත්‍ර නිෂ්ක්‍රියව පැවැතුණි.

(iii) නව රේගු ගොඩනැගිල්ලේ රු.21,643,754 ක් වැය කර ස්ථාපිත කර තිබූ පිවිසුම් පාලන පද්ධතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**---------------------------------------**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂයේදී භාණ්ඩ මිලදී ගැනීම් පිළිබඳ තොරතුරු සහ අපහරණය කරන ලද වත්කම් පිළිබඳ තොරතුරු ලේඛනගත කර එම වාර්තාව 2015 මාර්තු 31 දිනට පෙර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂක ජනරාල්වරයා වෙත යවා ඇති බව තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**----------------------------------------**

ශ්‍රී ලංකා රේගුව විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(i) ශ්‍රී ලංකා රේගුවට අයත් උතුරු නැගෙනහිර ප්‍රදේශයේ ඇති ඇතැම් ඉඩම් නීත්‍යානුකූල පැවරීමකින් තොරව ත්‍රිවිධ හමුදා විසින් භාවිතා කර තිබුණි.

(ii) ශ්‍රී ලංකා රේගුව විසින් නීත්‍යානුකූල පැවරීමකින් තොරව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මීගමුව මුන්නක්කරය පිහිටි ඉඩමක් ලබාදී තිබුණි.

(iii) ශ්‍රී ලංකා රේගුවට අයත් මීගමුව සෙල්ටි පාරේ හා මීගමුව ස්ටීවන් වෝක් පටුමගෙහි පිහිටි ඉඩම් නීත්‍යානුකූල පැවරීමකින් තොරව බාහිර පාර්ශවයන් විසින් භාවිතයට ගෙන තිබුණි.

**3.12 බේරුම් නොකළ බැරකම්**

---------------------------

ශ්‍රී ලංකා රේගුව විසින් 2015 දෙසැම්බර් 31 දනට බේරුම් නොකළ වර්ෂ 01 ට අඩු බැරකම් රු. මිලියන 21.13 ක් විය.

**3.13 අනුකූල නොවීම්**

--------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | **රු.** | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත | - | (i) සිගරට් නිෂ්පාදනය කරන සමාගමකට අදාළව එහි නියෝජිත ආයතනයක් හෝ තොග වෙළඳ ආයතනයක් විසින් හෝ නිෂ්පාදන බදු ගෙවීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකා රේගුවේ නිෂ්පාදන බදු අංශයේ ලියාපදිංචි වී නොතිබුණි.<br>(ii) රජය විසින් වරින් වර මිල වෙනස් කරන අවස්ථාවලදී නිෂ්පාදන බදු පනතේ 5 (1) හා 32 වගන්ති අනුව ආයතනයේ ගබඩාවල, ප්‍රාදේශීය නියෝජිත ගබඩාවල, තොග වෙළඳ ගබඩාවල පවතින සිගරට් තොගවලින් අදාළ පරිදි නිෂ්පාදන බදු ගලපා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**
**--------------------------------**

| | | | |
|---|---|---|---|
| (i) | XII පරිච්ඡේදය 1.7 වගන්තිය | - | ශ්‍රී ලංකා රෙගුවේ සමහර අංශවල 190 පොදු ආකෘති පත්‍රය ප්‍රකාරව නිවාඩු ලේඛනය පවත්වා නොතිබුණි. |
| (ii) | XII පරිච්ඡේදය 5.1 හා 8.1 වගන්ති | 297,141 | රාජ්‍ය සේවයේ නිලධාරියෙකුට වසරකට හිමි නිවාඩු දින ගණන 45 ක් වුවත් එම සීමාව ඉක්මවා නිලධාරීන් විසින් නිවාඩු ලබා ගෙන තිබූ අවස්ථා 05 ක් නිරීක්ෂණය විය.<br>එම නිලධාරීන් හිලව් නිවාඩු ඉල්ලුම් කර නොතිබූ අතර 2015 වර්ෂය සඳහා දිරි දීමනාද ගෙවා තිබුණි. |
| (iii) | XII පරිච්ඡේදය 22.4 වගන්තිය | - | කාර්ය මණ්ඩලය විසින් වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම පිළිබඳ තොරතුරු 96 වැනි පොදු ආකෘතිය ප්‍රකාරව විගණකාධිපති වෙත මාස්පතා වාර්තා කර නොතිබුණි. |
| (iv) | XV පරිච්ඡේදයේ 11.1 වගන්තිය | - | විදේශ ගත වන විට ව්‍යාපාරික පංතියේ ගමන් කළ නොහැකි නිලධාරින් අවස්ථා 03 කදී ව්‍යාපාරික පංතියේ ගමන් කර තිබූ අවස්ථා 03 ක් නිරීක්ෂණය විය. |

**(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාත්තාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**
**--------------------------------**

| | | | |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 272(1) | - | 2015 වර්ෂය සඳහා වූ ගෙවීම් වවුචර් අංක පිළිවෙලට ගොනුකර මිටි බැද නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 447(2) | - | වැය ලෙජරයේ එක් එක් වැය විෂය යටතේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදන හා අතිරේක ප්‍රතිපාදන නියමිත තැන්හි සටහන් කර මාණ්ඩලික නිලධාරියෙකු විසින් නිවැරදි බවට සහතික කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 447(3) | - | ඇස්තමේන්තු ප්‍රතිපාදන හා මුදල් රෙගුලාසි 66 මාරු කිරීම්වල එකතුව වැය ලෙජරයේ විධිමත් ලෙස සටහන් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iv) | මුදල් රෙගුලාසි 447(4) | - | බැරකම් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 565(3) | - | තැන්පත් ලෙජරවල තුලන ගිණුමක් පවත්වා නොතිබුණි. |
| (vi) | මුදල් රෙගුලාසි 565(5) | - | එක් එක් මාසය සඳහා පොදු 71 ආකෘති පත්‍රයේ පිළියෙල කරන මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊලඟ මාසයේ අවසන් වීමට පෙර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (vii) | මුදල් රෙගුලාසි 571(1) | - | තැන්පත් කළ දිනට වර්ෂ දෙක ඉක්ම වූ සියලු තැන්පත් සඳහා අර්ධ වාර්ෂික ලැයිස්තු පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. |
| (viii) | මුදල් රෙගුලාසි 751(1) | - | දෙපාර්තමේන්තුවට ලැබෙන සියලුම භාණ්ඩ වහාම බඩු ලේඛන පොතේ සටහන් කර නොතිබූ අවස්ථා පැවතුණි. |

**(ඇ) දෙපාර්තමේන්තු චක්‍රලේඛ**

-----------------------------

| | | | |
|---|---|---|---|
| (i) | 2010 අප්‍රේල් 28 දිනැති අංක 696 දරන චක්‍රලේඛය | 1,202,591 | තැන්පතු කුවිතාන්සිය පමණක් ඉදිරිපත් කළ අවස්ථා 06 කදී එකතුව රු.718,591 ක තැන්පත් නිදහස් කර තිබුණි. එමෙන්ම මගීන්ගේ ගමන් බඩු ප්‍රකාශන පත්‍රය (ඇතුල්වන) පමණක් ඉදිරිපත් කල අවස්ථා 04 කදී එකතුව රු.484,000 ක තැන්පතු නිදහස් කර තිබුණි. |
| (ii) | 2010 දෙසැම්බර් 19 දිනැති අංක 01/2010 දරන චක්‍රලේඛයේ 4 ඡේදය | - | කටුනායක ගුවන්තොටුපල මගී පර්යන්ත කාර්යාලයේ බැහැර යාමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 3.14 කාර්යසාධනය

-----------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ශ්‍රී ලංකා රේගුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ආදායම් එකතු කිරීම**

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත බදු ආදායම හා තථ්‍ය බදු ආදායම ඉකුත් වර්ෂයේ බදු ආදායම් සමඟ සසඳා පහත දැක්වේ.

| බදු වර්ගය | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| | සංශෝධිත ඇස්තමේන්තු අනුව බදු ආදායම | තථ්‍ය බදු ආදායම | තථ්‍ය බදු ආදායම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස | සංශෝධිත ඇස්තමේන්තු අනුව බදු ආදායම | තථ්‍ය බදු ආදායම | තථ්‍ය බදු ආදායම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
| **විදේශ වෙළඳාම මත බදු** | රු. මිලියන | රු. මිලියන | % | රු. මිලියන | රු. මිලියන | |
| ආනයන බදු | 92,000 | 108,116 | 117.51 | 85,000 | 77,726 | 91.44 |
| අපනයන බදු | 60 | 33 | 55.00 | 25 | 24 | 96.00 |
| වරාය හා ගුවන්තොටුපල බදු | 55,000 | 56,733 | 103.15 | 80,000 | 68,646 | 85.81 |
| සෙස් බදු (ආනයන) | 42,000 | 42,467 | 101.11 | 40,000 | 35,622 | 89.06 |
| මෝටර් රථ අනුග්‍රහක බදු | - | - | - | - | - | - |
| ප්‍රාදේශීය යටිතල පහසුකම් බදු | - | 0.29 | - | - | 1 | - |
| සෙස් බදු - (අපනයන) | 3,400 | 2,713 | 79.79 | 5,000 | 3,084 | 61.68 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 56,000 | 52,276 | 93.34 | 65,000 | 47,952 | 73.77 |
| වෙනත් | - | - | - | - | - | - |
| **නිෂ්පාදන බදු** | | | | | | |
| සිගරට් | 80,000 | 79,981 | 99.97 | 61,000 | 57,204 | 93.78 |
| මත්පැන් | - | - | - | - | 12 | - |
| ඛණිජතෙල් | 34,000 | 45,092 | 132.62 | 40,000 | 28,732 | 71.83 |
| මෝටර් රථ | 240,000 | 223,414 | 93.09 | 70,000 | 76,435 | 109.19 |
| අනෙකුත් | 10,000 | 3,812 | 38.12 | 7,000 | 3,087 | 44.10 |
| ඇගලුම් සඳහා දේශීය විකුණුම් මත ගාස්තු | 100 | 121 | 121.00 | 95 | 89 | 93.68 |
| දඩ හා රාජසන්තක කිරීම් | 1,400 | 1, 129 | 80.64 | - | - | - |
| **මුළු එකතුව** | **613,960** | **615,888** | **100.31** | **453,120** | **398, 614** | **87.97** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව ආදායම් සංකේත 16 ක් යටතේ රු.මිලියන 615,888 ක ආදායම් රැස් කර තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී ආදායම් සංකේත 15 ක් යටතේ රැස් කළ ආදායම රු.මිලියන 398,614 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.මිලියන 217,275 ක් හෙවත් සියයට 54.51 කින් වැඩි වී තිබුණි. මෙම වැඩිවීම කෙරෙහි මෝටර් රථ නිෂ්පාදන බදු, ඛණිජ තෙල් නිෂ්පාදන බදු,

සිගරට් නිෂ්පාදන බදු, ආනයන බදු හා අනෙකුත් නිෂ්පාදන බදු ආදායමේ වැඩිවීම බලපා තිබුණි. එමෙන්ම මෙම වැඩිවීම කෙරෙහි ඉහළ බදු අනුපාතයන් පැනවීම, ආනයනික භාණ්ඩ ප්‍රමාණය වැඩිවීම, විදේශ විනිමය අනුපාතයන්හි පිරිහීම, භාණ්ඩවල විදේශීය මිල ගණන් ඉහළ යාමද සැළකිය යුතු බලපෑමක් සිදු වී තිබුණි. එම බලපෑම මගින් රාජ්‍ය ආදායමට සිදු වී තිබුණු දායකත්වය මැන බැලීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් ශ්‍රී ලංකා රේගුව විසින් හඳුන්වා දී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවෙහි සමස්ථ ආදායම රු.මිලියන 615,888 කින් සියයට 17.55 ක් එනම් රු.මිලියන 108,116 ක් ආනයන බදු ආදායම් සංකේතය යටතේ රැස් කර තිබුණි. එය ඉකුත් වර්ෂයේ රැස්කල ආනයන බදු ආදායම සමඟ සැසඳීමේදී සියයට 39.1 ක වර්ධනයක් වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රේගුවේ මුළු බදු ආදායමින් සියයට 13ක ප්‍රමාණයක් සිගරට් මත නිෂ්පාදන බදුවලින් නිරූපනය වේ. 2014 වර්ෂයට වඩා 2015 වර්ෂයේදී එය රු.මිලියන 22,777 කින් හෙවත් සියයට 39.82 කින් වැඩි වී තිබුණි. එයට හේතු වශයෙන් සිගරට් නිෂ්පාදනය ඉකුත් වර්ෂයට වඩා ඒකක 349,065,680 කින් හෙවත් සියයට 9.6 කින් වර්ධනය වී තිබීම හා මුළු සිගරට් නිෂ්පාදනයෙන් සියයට 87 ක් පමණ දිග මි.මී. 73 සිට මි.මී.84 දක්වා ප්‍රමාණයේ සිගරට් වර්ගය වෙනුවෙන් අයකළ නිෂ්පාදන බද්ද ඉහළ දැමීම යනාදී කරුණු මූලික වශයෙන් බලපා තිබුණි.

(ඈ) 2015 වර්ෂයේදී ඛණිජ තෙල් නිෂ්පාදන බදු වශයෙන් රු.මිලියන 45,092 ක බදු ආදායමක් රැස්කර තිබුණි. එය ශ්‍රී ලංකා රේගුවේ රු.මිලියන 615,888 ක් වූ සමස්ථ බදු ආදායමෙන් සියයට 7.32 ක් නියෝජනය කර තිබුණි. එය ඉකුත් වර්ෂයට වඩා රු.මිලියන 16,360 කින් හෙවත් සියයට 56.94 කින් වැඩි වී තිබුණි. ඛණිජ තෙල් ආනයනය මත නිෂ්පාදන බදු ආදායම රු.මිලියන 34,639 ක් වී තිබුණු අතර, එය මුළු ඛණිජ තෙල් නිෂ්පාදන බදු ආදායමෙන් සියයට 76.82 ක ප්‍රමාණයක් වී තිබුණි. දේශීය ඛණිජ තෙල් පිරිපහදුව මත අයකළ නිෂ්පාදන බදු ආදායම රු.මිලියන 10,452 ක් වී තිබුණු අතර එය මුළු ඛණිජ තෙල් නිෂ්පාදන බදු ආදායමෙන් සියයට 23.18 ක් වී තිබුණි. තවද එම බදු ආදායම තුළ වූ රු.මිලියන 4,107 ක ආදායම ඉකුත් වර්ෂයට අදාළව රැස් කළ ආදායමක් වී තිබුණි. ඛණිජ තෙල් ආනයනය මත නිෂ්පාදන බද්ද ඉකුත් වර්ෂයට වඩා රු.මිලියන 16,940 කින් හෙවත් සියයට 95.71 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඛණිජ තෙල් පිරිපහදුව මත අයකල නිෂ්පාදන බදු ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 2,229 කින් හෙවත් සියයට 26 කින් අඩු වී තිබුණි. තෙල් පිරිපහදු කිරීම වෙනුවට ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පිරිපහදු කළ තෙල් ආනයනය වැඩි කිරීම මුළු නිෂ්පාදන බදු වැඩිවීම සඳහා මූලික වශයෙන් බලපා තිබුණු අතර දේශීයව පිරිපහදු කළ පෙට්‍රල් හා ඩීසල්, අඩුවෙන් නිකුත් කිරීමත්, ආනයනික පෙට්‍රල් හා ඩීසල් වැඩියෙන් නිකුත් කිරීමත් පිරිපහදුව මත අයකළ නිෂ්පාදන බද්ද අඩුවීමට බලපා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව මෝටර් වාහන නිෂ්පාදන බදු ආදායම් සංකේතය යටතේ රු.මිලියන 223,414 ක ආදායමක් රැස් කර තිබුණි. ඉකුත් වර්ෂයේදී රැස් කළ ආදායම රු.මිලියන 76,435 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 146,979 ක හෙවත් සියයට 192.29 කින් ආදායම වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයන්හිදී ආනයනික වාහන සඳහා බදු අයකිරීමේදී රේගු තීරු බදු, එකතු කළ අගය මත බදු, නිෂ්පාදන බදු, ජාතිය ගොඩනැගීමේ බදු, වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු වර්ග කිහිපයක් යටතේ බදු අයකිරීමට කටයුතු කර තිබුණි. එහෙත් 2014 ඔක්තෝබර් 24 දිනැති අංක 1885/42 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් නිකුත් කර තිබූ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ඉහත සඳහන් කර තිබුණු බදු වර්ග වෙනුවට ආනයනික වාහන මත ඉහළ නිෂ්පාදන බද්දක් පැනවීමත්, රේගු මිල කමිටුව විසින් නිශ්චය කර තිබූ වාහන තක්සේරු වටිනාකම් වරින් වර අඩු කිරීම හේතුවෙන් ආනයනික වාහන ප්‍රමාණය වැඩිවීමත් සහ - සහනදායී වාහන ආනයන බලපත්‍ර මත සිදු කරන වාහන ආනයනයන් වැඩිවීමත් යන කරුණු

හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මෝටර් රථ නිෂ්පාදන බදු ආදායම විශාල වශයෙන් වැඩිවී තිබුණි.

(ඊ) 2015 වර්ෂයේදී සංශෝධිත ඇස්තමේන්තුව අනුව අපේක්ෂිත බදු ආදායමේ තථ්‍ය කාර්යසාධනය සියයට 0.31 කින් වැඩි වී තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී එය සියයට 12.03 කින් අඩු වී තිබුණි.

(උ) ආදායම් සංකේත 05 ක් අතරින් රු.මිලියන 50,000 ක් ඉක්මවූ ආදායම් ඇස්තමේන්තු කර තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී ආනයන බදු ආදායම හා වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු ආදායම යන ආදායම් සංකේත දෙක පමණක් අපේක්ෂිත ඉලක්කය ඉක්මවීමට සමත් වී තිබුණි. එයද සුළු ඉක්මවීමක් පමණක් නිරීක්ෂණය විය. එම ආදායම් සංකේතවල කාර්යසාධනය පිළිවෙලින් සියයට 117.51 ක් හා සියයට 103.15 ක් වී තිබුණි.

(ඌ) විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 80,000 ක් වූ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 56,000 ක් දක්වා සංශෝධනය කර තිබුණද, රු.මිලියන 52,275 ක අදායමක් රැස්කර තිබුණි. එසේ රැස් කළ බදු ආදායම මූලික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 65.34 ක් වූ අතර සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 93.35 ක් විය. එසේම ඛණිජ තෙල් නිෂ්පාදන බදු ආදායම් සංකේතයට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 50,000 ක් වූ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 34,000 දක්වා අඩු කර තිබුණද රැස්කළ ආදායම රු.මිලියන 45,092 ක් වී තිබුණි. ඒ අනුව තථ්‍ය අදායම සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවද ඉක්මවා තිබුණි.

(එ) අනෙකුත් නිෂ්පාදන බදු සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී රැස්කර තිබූ ආදායම රු.මිලියන 3,087 ක්ව තිබියදී සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 7,800 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. පසුව එය රු.මිලියන 10,000 ක් දක්වා සංශෝධනය කර තිබුණි. එහෙත් රැස් කර ගෙන තිබුණු ආදායම රු.මිලියන 3,812 ක් විය. රැස් කළ බදු ආදායම මූලික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 48.87 ක් වූ අතර සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 38.12 ක් වී තිබුණි.

(ඒ) නව ආදායම් විෂයයක් ලෙස දඩ මුදල් හා රාජසන්තක කිරීම් ආදායම් සංකේතය යටතේ සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 3,000 ක් වූ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 1,400 දක්වා එනම් මූලික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 46 ක් දක්වා සංශෝධනය කර තිබුණි. එසේම රැස් කර තිබූ ආදායම රු.මිලියන 1,129 ක් ලෙස ආදායම් ගිණුමේ දක්වා තිබුණද, වැරදි ලෙස ඇතුළත් කර තිබුණු මෙම ආදායම් සංකේතයට අදාළ නොවන එකතුව රු.මිලියන 201 ක් වූ 2013 හා 2014 වර්ෂවලට සහ 2015 ජනවාරි සිට නොවැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ අතිකාල දීමනාව ඉවත් කළ විට මෙම ආදායම් සංකේතය යටතේ රැස්කර ගෙන තිබුණු සත්‍ය ආදායම රු.මිලියන 928 ක් විය. එය මූලික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 31 ක් සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 66 ක් පමණක් වී තිබුණි.

## 3.15 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

ශ්‍රී ලංකා රේගුව විසින් සිදු කර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2014 වර්ෂය වන විට ශ්‍රී ලංකාව තුළ වාහන අමතර කොටස් එකලස් කර වාහන නිෂ්පාදනය කරන ආයතන විසින් එම වාහනවල කර්මාන්ත ශාලා මිලෙන් සියයට 150 ක සිට සියයට 240 ක් දක්වා වූ පරාසයක් තුළ නිෂ්පාදන බද්දක් ගෙවිය යුතුව තිබුණි. එහෙත් එම වාහන සඳහා සියයට 30 කට වැඩි දේශීය අගය එකතු කිරීමක් සිදුකරන්නේ නම් එම නිෂ්පාදන බද්ද ගෙවීමට අවශ්‍ය නොවන ලෙස විධිවිධාන සලසා තිබුණි. 2014 ඔක්තෝබර් 24 දිනැති අංක

1885/42 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් නැවත සියයට 30 ක දේශීය අගය එකතු කිරීම තහවුරු කරන වාහන සඳහාද කර්මාන්තශාලා මිලෙන් සියයට 15ක නිෂ්පාදන බද්දක් පනවා තිබුණි. එහෙත් වාහන සඳහා සියයට 30 ක දේශීය අගය එකතු කිරීම පිළිබඳව විධිමත් සොයා බැලීමකින් තොරව වාහන අමතර කොටස් ආනයනය කර තිබුණු අවස්ථාවේදීම අදාළ නිෂ්පාදන බද්ද අයකර තිබුණු අවස්ථා පැවති අතර එහිදී සිදුවිය හැකි විශාල බදු අලාභය නොසලකා කටයුතු කිරීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය. එසේ වාහන කොටස් එකලස් කර වාහන නිපදවන එක් ආයතනයකින් 2015 ජනවාරි 27 දින ආනයනය කර තිබූ මෝටර් රථ වැසි 750 ක් හා අමතර කොටස් සඳහා සියයට 15 ක නිෂ්පාදන බදු ලෙස ආනයනය සිදු කළ දිනට පසු රු.136,305,337 ක් අයකර ගෙන තිබුණි.

(ආ) ශ්‍රී ලංකාව තුළ වාහන කොටස් එකලස් කර වාහන නිෂ්පාදනය කරන ආයතනයක් විසින් වාහන මාදිලි 04 කට අදාළව නිෂ්පාදන බදු සහන ලබා ගැනීම සඳහා කලින් ඉදිරිපත් කර තිබුණු කර්මාන්තශාලා මිල ගණන් පසුව අඩුකර ඉදිරිපත් කර තිබූ බව නිරීක්ෂණය විය. එසේ මිල අඩු කිරීම සඳහා හේතු වූ කරුණු පිළිබඳව විධිමත් සොයා බැලීමකින් තොරව ශ්‍රී ලංකා රේගුව විසින් නිෂ්පාදන බදු අයකර තිබූ අතර එය විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය. ඒ අනුව එම ආයතනය විසින් 2014 ඔක්තෝබර් 24 දින සිට 2015 නොවැම්බර් 20 දින දක්වා වාහන 5,109 ක් සඳහා දළ වශයෙන් රු.මිලියන 403 ක පමණ නිෂ්පාදන බදු මුදලක් අඩුවෙන් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) ශ්‍රී ලංකාව තුළ වාහන එකලස් කරන ආයතන විසින් ලබා ගන්නා ලද නිෂ්පාදන බදු සහන ප්‍රතිලාභයට සාපේක්ෂව ප්‍රමාණවත් දායකත්වයක් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවේද යන්න මතභේදයට තුඩුදෙන කරුණක් විය. ඒ අනුව එක් ආයතනයක් විසින් 2014 ඔක්තෝබර් 01 දින සිට 2015 නොවැම්බර් 20 දින දක්වා කාලය තුළ රේගු සංයෝජිත වර්ගීකරණ අංක 09 ක කාණ්ඩ 27 ක් යටතේ එකලස් කර තිබුණු වාහන 5829 ක් වෙනුවෙන් ගෙවා තිබූ නිෂ්පාදන බදු ප්‍රමාණය ආසන්න වශයෙන් රු.මිලියන 1,531 ක් වී තිබුණි. එම වාහන සඳහා සාමාන්‍ය ක්‍රමය යටතේ අයවිය යුතුව පැවති නිෂ්පාදන බද්ද දළ වශයෙන් රු. මිලියන 13,177 ක් පමණ වුවද, එම සියළුම වාහන සඳහා සියයට 30 ක දේශීය අගය එකතු කිරීම දළ වශයෙන් රු. මිලියන 2,673 ක් වී තිබුණි. තවද, මෙම වාහන 5829 සඳහා දේශීය අගය එකතු කිරීම් හා අයකළ නිෂ්පාදන බද්දේ එකතුව රු.මිලියන 4,204 ක් විය. ඒ අනුව රු.මිලියන 2,673 ක දේශීය අගය එකතු කිරීම් සඳහා ශ්‍රී ලංකා රජය විසින් කැපකර තිබූ බදු ආදායම රු.මිලියන 8,973 ක් පමණ විය.

(ඈ) 1996 වර්ෂයේ සිට 2002 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ශ්‍රී ලංකා රේගුවේ පවත්වා තිබූ රු.109,400,000 ක් වටිනා බැඳුම්කර වගකීමක් 2014 ජනවාරි මාසය වන විටත් ශ්‍රී ලංකා රේගුව විසින් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද, පසුව මේ පිළිබඳව සිදු කරන ලද රේගු විමර්ශනයකින් අනතුරුව රු.57,736,913 ක මුදලක් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ශ්‍රී ලංකා රේගුව වෙත ගෙවා තිබුණු අතර එම මුදලින් රු.28,868,456 ක් ශ්‍රී ලංකා රේගුව විසින් රේගු නිලධාරීන්ට ත්‍යාග මුදල් ලෙස ගෙවා තිබුණි.

රාජ්‍ය ආයතනයක් වන ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව වෙතින් අයවිය යුතු බැඳුම්කර මුදලින් කොටසක් අයකර ගෙන නිලධාරීන්ට ත්‍යාග මුදල් ගෙවීම මතභේදයට තුඩු දෙන කරුණක් වූ අතර අදාළ මුදල් අයකර ගැනීම ශ්‍රී ලංකා රේගුවේ වගකීමක් බව නිරීක්ෂණය විය. එසේම ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ශ්‍රී ලංකා රේගුවට ගෙවා තිබූ මෙම මුදල භාණ්ඩාගාරය විසින් ඛණිජ තෙල් සංස්ථාව වෙත ප්‍රතිපූර්ණය කිරීමටද එකඟවී ඇති බව ලිපිලේඛන අනුව තවදුරටත් නිරීක්ෂණය විය. තවද මුළු බැඳුම්කර මුදල වූ රු.109,400,000 ක් අතහැර තිබූ රු.51,663,087 ක බැඳුම්කර මුදල සම්බන්ධයෙන්ද ශ්‍රී ලංකා රේගුව විසින් විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ඉ) 2015 මැයි 01 දින සිට 2015 සැප්තැම්බර් 04 දින දක්වා කාලය තුල TRJ 150W ප්‍රාඩෝ නැමැති මාදිලියේ වාහන 406 ක් ආනයනය කර තිබූ අතර එම වාහන අතුරින් වාහන 101 ක් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම වාහන ජපානයේ පැවැති වාහන වෙන්දේසිවලින් මිලදී ගෙන තිබුණු අතර ලබාගත හැකි වූ තොරතුරු අනුව එම එක් එක් වාහනය මිලදී ගැනීම සඳහා එකතුව රු.439,687,737 ක් වැය කර තිබුණි. රේගු බදු කටයුතු සඳහා වටිනාකම්වල එකතුව ලෙස රු.298,306,703 ක් දක්වා තිබීම හේතුවෙන් අවම වශයෙන් රු.141,381,034 කින් වටිනාකම් ඌන තක්සේරු කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) මෙම වාහන අතරින් වාහන 83 ක් සහනදායී වාහන බලපත්‍ර යටතේ ආනයනය කර තිබූ අතර, එම වාහන වෙන්දේසියේදී අලෙවි වූ වටිනාකම සමඟ සැසඳීමේදී සහනදායී බලපත්‍රයේ උපරිම සීමාව වන ඇ.එ.ඩො. 35,000 ක සීමාව ඉක්මවා තිබුණි. ඒ අනුව එම වාහන සාමාන්‍ය ආනයනයන් ලෙස සලකා රේගු බදු හා ගාස්තු ගණනය කලේ නම් අහිමි වී තිබූ රේගු බදු වටිනාකම දළ වශයෙන් රු.694,341,628 ක් විය.

(iii) මෙම වාහන ආනයනය කිරීමේදී රේගුවට ඉදිරිපත් කළ ඉන්වොයිසි පත්වල දක්වා තිබුණු වටිනාකම සඳහා පමණක් බැංකු ක්‍රමය මගින් විනිමය හුවමාරු විය හැකි වුවද, සත්‍ය ආනයනික පිරිවැය ආවරණය කිරීම සඳහා අවශ්‍ය අතිරේක විදේශ විනිමය ප්‍රමාණය හුවමාරුවූ ආකාරය විගණනයේදී මතභේදයට තුඩු දෙන කරුණක් විය.

(ඊ) ආනයනකරුවකුගේ ඉල්ලීම මත ආනයනික BMW 520D SE නැමැති මාදිලියේ වාහනවල තක්සේරු මිල රේගු තක්සේරු කමිටුව විසින් අඩු කර තිබීම හේතුවෙන් එම වර්ගයේ වාහන 07 කින් දළ වශයෙන් රු.9,051,973 ක රේගු බදු අලාභයක් සිදු වී ඇති බව නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධයෙන් තවදුරටත් නිරීක්ෂණය වූ කරුණු කීහිපයක් පහත දැක්වේ.

(i) 2014 දෙසැම්බර් 24 දින වන විට BMW 520D SE මාදිලියේ වාහන සම්බන්ධයෙන් රේගු තක්සේරු කමිටුව විසින් නියම කර තිබූ වටිනාකම ඇ.එ.ඩො. 30,300 ක් වූ අතර එම මිල පදනම් කරගෙන 2014 දෙසැම්බර් 23 දින ශ්‍රී ලංකාවට ආනයනය කර තිබූ ඉහත සඳහන් වාහන 07 ට අදාළ තොරතුරු රේගු පරිගණක පද්ධතියට ඇතුළත් කර තිබුණි. ඒ අනුව එක් වාහනයට රු.5,361,243 බැගින් වාහන 07 සඳහා ගෙවිය යුතු සම්පූර්ණ රේගු බද්ද රු.37,528,701 ක් ලෙස ගණනය කර තිබුණද, එම වටිනාකම ගෙවීමට ආනයනකරුවන් කටයුතු කර නොතිබුණි.

(ii) උක්ත වාහන පිළිබඳ තොරතුරු රේගු පරිගණක පද්ධතියට ඇතුළත් කර තිබියදී එම වාහන මාදිලියේ තක්සේරු වටිනාකම 2015 ජනවාරි 05 දින හා යුරෝ 23,000 (ඇ.එ.ඩො. 27148) ක් හා ඉන් දින 08 කට පසුව එනම් 2015 ජනවාරි 13 දින යුරෝ 22600 (ඇ.එ.ඩො. 26,675) දක්වා අඩු කිරීමට රේගු මිල කමිටුව කටයුතු කර තිබුණි.

(iii) රේගු මිල කමිටුව විසින් අවසන් වරට තීරණය කර තිබූ තක්සේරු වටිනාකම පදනම් කර ගෙන ඉහත සඳහන් කර තිබුණු වාහන 07 හි බදු ගණනය කිරීමට කටයුතු කර තිබුණු අතර ඒ අනුව එක් වාහනයකට රු.4,068,104 ක් බැගින් රු.28,476,728 ක් පමණක් අයකර ගැනීමට කටයුතු කර තිබුණි.

(iv) වාහන ආනයනය කිරීමේදී තීරණය කර තිබූ තක්සේරු වටිනාකම පදනම් කර ගෙන බදු අයකර ගැනීම වෙනුවට ආනයනකරුගේ ඉල්ලීම පරිදි තක්සේරු මිල ගණන් අඩු කර බදු අයකර ගැනීමට කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය වීම හේතුවෙන් දළ වශයෙන් රු.9,051,973 බදු අලාභයක් සිදු වී තිබුණි.

(v) උක්ත වාහන 07 ආනයනය කළ දින හා ඊට ආසන්න දිනයන්හිදී ආනයනය කර තිබූ එම මාදිලියට සමාන මාදිලියේ වාහන 05 ක් සඳහා බදු ගණනය කිරීමේදී ඇ.එ.ඩො 30,300 ක වටිනාකම පදනම් කර ගෙන බදු ගණනය කිරීමට කටයුතු කර තිබුණි.

(උ) අතිකාල අරමුදල මගින් අතිකාල ගෙවීම් ක්‍රියාවලියේදී නිවාඩු දිනකට පෙ.ව. 8.00 සිට පසු දින පෙ.ව.8.00 දක්වා වූ පැය 24 ක් සඳහා පැය 27 ක අතිකාල දීමනාවක් ද, සාමාන්‍ය දිනකට ප.ව. 4.45 සිට පසු දින පෙ.ව. 8.00 දක්වා වූ පැය 15¼ සඳහා පැය 18 ¾ ක අතිකාල දීමනාවක්ද ලබා ගැනීමට හැකිවන ආකාරයට අතිකාල සේවයේ යෙදවීමට ඉඩ සලසා තිබුණද, ඒ සඳහා ලබාගත් අනුමැතිය විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඌ) 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන ගැසට්පත්‍රයේ නිවේදනයේ 4(1) ඡේදය ප්‍රකාරව රේගුවේ නිලධාරීන් සඳහා වන සාමාන්‍ය රාජකාරි වේලාවලින් පිටස්තර වේලාවන්හිදී හෝ රාජකාරි සඳහා රේගුව වසා ඇති දිනවල හෝ එම නිලධාරීන් ඉටු කරන සේවා සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන්ද විමසා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වරින් වර තීරණය කරනු ලබන ගෙවීම් ප්‍රමාණවලට අනුව එම රේගු නිලධාරීන්ට අතිකාල දීමනා ගෙවීමට අධ්‍යක්ෂ ජනරාල්ට හැකි බව දක්වා තිබුණත්, එවැනි අනුමැතියක් ශ්‍රී ලංකා රේගුවේ අතිකාල ගෙවීම් සම්බන්ධයෙන් ලබාගෙන නොතිබුණි.

(එ) ඇතැම් නිලධාරීන් මාසයකට අදාළ මුළු පැය ගණන ඉක්මවා අතිකාල සේවයේ නිරත වීම හා අතිකාල ලේඛනය අනුව වර්ෂයේ සැලකිය යුතු මාස ගණනක් අඛණ්ඩවම රාජකාරි හා අතිකාල සේවයේ නිරතවීම යනාදිය අතාත්ත්වික තත්ත්වයන් නිරීක්ෂණය විය.

(ඒ) 2014/2015 වර්ෂයේ අවස්ථා කීපයකදී ආපන ශාලාවේ ආහාරවල ගුණත්වය හා ආහාර පිළියෙල කිරීමේ දුර්වලතා පිළිබඳව කාර්ය මණ්ඩලය විසින් පැමිණිලි කර තිබුණද, 2015/2016 වර්ෂය සඳහාද ආපන ශාලාව පවත්වාගෙන යාම එම ආයතනයටම ලබා දී තිබුණි.

## 3.16 අවිධිමත් ගනුදෙනු

-------------------

ශ්‍රී ලංකා රේගුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවන් පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකා රේගුව විසින් සීමාසහිත ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගමට පවරන ලද ස්කෑන් යන්ත්‍ර සඳහා සේවා ගාස්තු ලෙස 2009 මැයි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා රු.4,887,500 ක් ශ්‍රී ලංකා රේගුව විසින් ගෙවා තිබුණි. එම මුදල 2016 අප්‍රේල් 30 දින වන විටත් සීමාසහිත ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමෙන් අයකර ගෙන නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 6.3.3 (ආ) මාර්ගෝපදේශය අනුව ලංසු වැසීම සමගම හැකිතාක් ඉක්මනින්, ලංසුකරුවන් හෝ පැමිණීමට කැමති ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරිපිටදී ලංසු විවෘත කළ යුතු වුවත්, ශ්‍රී ලංකා රේගුව විසින් ආපනශාලාව පවත්වාගෙන යාම සම්බන්ධ ලංසු විවෘත කිරීමේ ක්‍රියාවලියේදී ආයතන 03 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

## 3.17 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩ හා මගී ප්‍රවාහන අරමුණින් බැහැරව විශේෂිත කාර්යයන් සඳහා ඉතාමත් අඩු රේගු බදු අය කරනු ලබන සංයෝජිත වර්ගීකරණ අංක 8705 යටතේ වාහන ආනයනය කිරීමේදී සිදුවන බදු අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් පසුගිය වර්ෂ කිහිපයක සිටම විගණනය විසින් පෙන්වා දී තිබුණද, එම අක්‍රමිකතාවයන් වලක්වා ගැනීම සඳහා රේගුව විසින් ක්‍රමවත් පාලන පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත ගිණුම් වර්ෂය තුළදීද, තවදුරටත් නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) භාණ්ඩ හා මගී ප්‍රවාහන අරමුණින් හැර විශේෂිත කාර්යයන් සඳහා ඉතා අඩු රේගු බදු අය කරනු ලබන රේගු බදු සංයෝජිත වර්ගීකරණ අංක 8705 යටතේ විශේෂිත කාර්ය වෑන් රථ ආනයනය කිරීමට ඉඩ දී තිබුණි. එම වෑන් රථයක උපරිම ආයු කාලය වසර 07 ක් වුවත්, එම කාලය ඉක්මවූ වෑන් රථ 160 ක් ආනයනය කර තිබුණි.

(ii) විශේෂිත කාර්ය වාහන ලෙස පැරණි වෑන් රථ ධාවනයට එක්වීම නිසා වායු දූෂණය ඉහළ යාම හා වෑන් රථවල ඵලදායී ආයුකාලය අඩුවීම යනාදී සමාජ ගැටළු ඇතිවීම මෙන්ම එම වාහන භාණ්ඩ ප්‍රවාහන හෝ මගී ප්‍රවාහන වෑන් රථ ලෙස ලියාපදිංචි කිරීමට අවස්ථාව සලසා තිබුණි.

(iii) 2015 නොවැම්බර් 22 දින මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලැබූ අයවැය යෝජනාවලට අනුව විශේෂිත කාර්ය වෑන් රථ සඳහා සියයට 150 දක්වා වැඩි කරන ලද රේගු බද්ද ගෙවීම් මගහැරීම සඳහා ආනයනකරුවන් 2015 නොවැම්බර් 22 දිනට පසුව කොළඹ වරාය පරිශ්‍රයට පැමිණි වෑන් රථ 23 ක් සඳහා ඊට පෙර දිනයන් යොදා සකස් කළ රේගු සටහන්කර රේගු පරිගණක පද්ධතිය වෙත සම්ප්‍රේෂණය කර රු.129,986,739 ක පමණ රේගු බදු රජයට අහිමි කිරීමක් සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගැනීමේ මූලික අරමුණින් යුතුව අඩු රේගු බදු මුදලක් ගෙවා ආනයනය කරන ලද වාහන මෙරටදී මගීන් ප්‍රවාහනය සඳහා භාවිතයට ගන්නා සුඛෝපභෝගී මෝටර් වාහන බවට පරිවර්තනය කිරීම මගින් විශාල රේගු බදු අහිමි කිරීමක් සිදු වෙමින් පැවති බව විගණනයට නිරීක්ෂණය විය. එවැනි වාහන 26 කින් අහිමි වී තිබුණු බදු ආදායම ආසන්න වශයෙන් රු.124,176,870 ක් විය. මෙම වාහන සම්බන්ධයෙන් 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත අනුව කටයුතු කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට විශේෂ වගකීමක් පැවති බවද නිරීක්ෂණය විය.

(ඇ) රේගු සටහන්කර අංක CBMV I 2065 යටතේ ආනයනය කර තිබූ ඩබල් කැබ් රථයක් ලෙස නිරීක්ෂණය වන ඩිපෙන්ඩර් රථයක් සඳහා සිංගල් කැබ් රථ සඳහා අදාළ වන අඩු රේගු බද්දක් ගෙවා රේගුවෙන් නිදහස් කර ගැනීම හේතුවෙන් දළ වශයෙන් රු.3,469,722 ක රේගු බදු ආදායම් අහිමි වී තිබුණි.

(ඈ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබූ මෝටර් කාර් රථය (ස්ටේෂන් වැගන්) සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී එම රථය සිංගල් කැබ් රථයක් සඳහා වන රේගු සංයෝජිත අංක 8704- 21-51යටතේ අඩු රේගු බද්දක් ගෙවා රේගුවෙන් නිදහස් කරගෙන තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව එම වාහනයෙන් දළ වශයෙන් රු.10,468,579 ක පමණ රේගු බදු අහිමිවීමක් සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය.

**3.18 අනාර්ථික ගනුදෙනු**
**-----------------------**

රේගු මන්දිරය අලංකරණයට රු.9,133,100 ක් වැය කර මල් බඳුන් 311 ක් මිලදී ගෙන තිබුණද, භෞතික පරීක්ෂාවේදී මල් බඳුන් 05 ක ඌනතාවයක් තිබුණි.

**3.19 කළමනාකරණ දුර්වලතා**
**--------------------------**

නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ලබාගත හැකිවූ තොරතුරු අනුව 2015 වර්ෂයේදී දුම්කොළ සමාගමක් විසින් සිගරට් ඒකක මිලියන 3,965 ක් නිෂ්පාදනය කර තිබුණි. එම නිෂ්පාදන මත රජය විසින් රු.මිලියන 81,155 ක්

නිෂ්පාදන බදු ලෙස අයකර ගෙන තිබුණි. එම සමාගමේ වාර්ෂික වාර්තාව අනුව සිගරට් සඳහා තොග නේවාසික කාලය දින 04 ක් වූ අතර 2015 වර්ෂය පමණක් සැලකිල්ලට ගත් විට වරකට පවත්වාගත යුතු තොග ප්‍රමාණය ඒකක මිලියන 43.45 ක් පමණ විය. එහෙත් සමාගම විසින් මහනුවර හා කොටහේන ප්‍රදේශවල තොග ඒකක මිලියන 296 ක් ගබඩා කළ හැකි වන පරිදි ගබඩා 02 ක් පවත්වා තිබුණි. ඒ අනුව තොග නේවාසික කාලය තුළ පවත්වාගෙන යා යුතු ඒකක ප්‍රමාණය ඉක්මවා සිගරට් ඒකක මිලියන 253 පමණ අතිරික්ත තොගයක් පවත්වාගත හැකිව තිබුණු බව නිරීක්ෂණය විය. එහෙත් රජය විසින් සිගරට් මත වූ නිෂ්පාදන බද්ද ඉහළ දමන කිසිදු අවස්ථාවක ඉහත සඳහන් පරිදි ගබඩාවල පවත්වාගෙන යනු ලබන තොග සහ ප්‍රාදේශීය නියෝජිත ආයතන හා ප්‍රාදේශීය තොග වෙළඳුන් යනාදී පාර්ශවයන් භාරයේ පවතින සිගරට් තොග සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් නිෂ්පාදන බදු අයකිරීමක් සිදු කර නොතිබුණි.

රජය විසින් 2014 හා 2015 වර්ෂවලදී සිගරට් සඳහා වූ නිෂ්පාදන බදු පිළිවෙලින් රු.5 කින් හා රු.2.14 කින් වැඩි කර තිබුණු අතර එම සමාගම සතු ප්‍රාදේශීය ගබඩා දෙකේ පමණක් උපරිම ධාරිතාවයකින් යුතුව තොග ගබඩා කර තිබුණේ නම් 2014 හා 2015 වර්ෂවලදී රජයට අතිරේකව අයවිය යුතුව පැවති බදු වටිනාකම දළ වශයෙන් රු.මිලියන 1,480 ක් හා රු.මිලියන 633 ක් විය. 1990 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලපරාසය තුළ අවස්ථා 36 කදී බදු අනුපාතය සංශෝධනය කර තිබුණද, එම කිසිදු අවස්ථාවක ගබඩාවල පවතින තොග සඳහා බදු අයකිරීමක් සිදු කර නොතිබුණි.

(ආ) ආනයනික භාණ්ඩ පරීක්ෂාව සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී රේගු සටහන් කර 185,683 කින් ආනයනික භාණ්ඩ ඇතුළත් පූර්ණ බහාළුම් 410,153 ක් ආනයනය කර තිබුණි. එම බහාළුම් අතරින් සියයට 80.42 ක් එනම් 329864 ක් බදු ගෙවීමට යටත්ව (Domestic Use) ආනයනික භාණ්ඩ ඇතුළත් බහාළුම් විය. අනෙකුත් බහාළුම් බදු නිදහස් පහසුකම්, බැඳුම්කර හා ආයෝජන මණ්ඩලය යටතේ ඇති ආයතන වෙත ආනයනය කළ භාණ්ඩ ඇතුළත් බහාළුම් විය.

(ii) බදු ගෙවීමට යටත්ව ආනයනය කළ භාණ්ඩ ඇතුළත් බහාළුම්වලින් (Domestic Use) 212,200 ක් හෙවත් සියයට 64.33 ක් පහසු නිදහස් කිරීම් (Amber Channel) යටතේද, බහාළුම් 90,012 ක් හෙවත් සියයට 27.28 ක් ආනයනකරුවන්ගේ පරිශ්‍රයන්හිදීද බහාළුම් 15,457 ක් හෙවත් සියයට 4.69 ක් පරීක්ෂා කිරීමකින් තොරවද නිදහස් කර තිබුණි. බහාළුම් 10097 ක් හෙවත් සියයට 3.06 ක් විස්තරාත්මක පරීක්ෂා කිරීම් (Detail Channel) යටතේද, බහාළුම් 1,293 ක් හෙවත් සියයට 0.39 ක් අධිඅවදානම් පරීක්ෂා කිරීම් (High Risk Channel) යටතේද, බහාළුම් 554 ක් හෙවත් සියයට 0.17 ක් අවදානම් පරීක්ෂා කිරීම් (Red Channel) යටතේද නිදහස් කර තිබුණි. ඒ අනුව බහාළුම් 11,944 ක් හෙවත් සියයට 3.62 ක් පමණක් විධිමත් පරීක්ෂණ ක්‍රියාවලියකට යොමු කර තිබුණු බවත්, සියයට 96.38 ක් ප්‍රමාණවත් පරීක්ෂා කිරීමකින් තොරව නිදහස් කර තිබුණු බවත් නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා රේගුව තුළ නිරන්තරයෙන් සිදු වන පහත ආකාරයේ වැරදි අනාවරණය කර ගැනීමටත්, ඒ තුළින් රජයට සිදු වන බදු අලාභයන් අවම කර ගැනීමටත්, පවත්නා භාණ්ඩ පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය තුළින් ප්‍රමාණවත් පිටුවහලක් සිදු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

- නීති විරෝධී ආනයනයන් සිදු වීම
- ප්‍රකාශ කළ ප්‍රමාණයට වඩා වැඩියෙන් භාණ්ඩ ආනයනය කිරීම
- ප්‍රකාශ කළ භාණ්ඩවලට වෙනස් භාණ්ඩ ආනයනය කර තිබීම.
- වැරදි වර්ගීකරණයන් ප්‍රකාශ කර තිබීම
- මිල ඌණ තක්සේරු කර ආනයනය කර තිබීම

ඒ අනුව ඉහත වැරදි අනාවරණය කර ගැනීමට හැකි වන අයුරින් පවත්නා ක්‍රමවේදය විධිමත් කිරීමේ අවශ්‍යතාවයක් විගණනයේදී නිරීක්ෂණය විය. තවද, නිලධාරීන් විසින් පරීක්ෂාවට ලක් කරන ලද සීමිත බහාළුම් සංඛ්‍යාවන් ද, වෙනත් විධිමත් අභ්‍යන්තර පරීක්ෂාවකට ලක් කළ හැකි ආකාරයේ වැඩපිළිවෙලක් සකස් කිරීමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) රේගු පරීක්ෂාවේ ස්වභාවය තීරණය කිරීම, ස්ක්‍රීනින් (Screening) අංශයට අනුයුක්ත නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂකවරු විසින් සිදු කරන අතර, ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. අදාළ නිලධාරීන්ගේ පළපුරුද්ද හා ආනයනකරුගේ ඉතිහාසගත තොරතුරු අනුව පරීක්ෂණ ක්‍රමවේදය තීරණය කෙරෙන බවට කරුණු ඉදිරිපත් කෙරුණද, ආනයනකරුගේ ඉතිහාසගත තොරතුරු සහ වැරදි හඳුනාගැනීමට අදාළ තොරතුරු පද්ධතියක් ස්ක්‍රීනින් අංශය තුළ ස්ථාපිත කර නොතිබුණු බැවින්, පරීක්ෂණ ක්‍රමවේදය නිලධාරීන්ගේ අභිමතය පරිදි තීරණය කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන වාහනවල විදේශීය වෙළඳපොළ වටිනාකම ආනයනකරුවන් විසින් අඩුවෙන් ප්‍රකාශ කර රේගු බදු ආදායම වංචා කිරීම වැළැක්වීම සඳහා 2014 අප්‍රේල් 07 දින මුදල් අමාත්‍යවරයා විසින් අංක 1857/03 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මගින් වාහන සඳහා බදු අයකිරීමේදී පදනම් කරගත යුතු වටිනාකම තීරණය කිරීමේ බලය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරා තිබුණි. රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආනයනික වාහන මිල තීරණය කිරීම සඳහා කමිටුවක් පත් කර තිබුණු අතර එම කමිටුවේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ අඩුපාඩු කිහිපයක් පහත දැක්වේ.

(i) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත්කළ කමිටුවට රේගු නිලධාරීන් දෙදෙනෙකු පමණක් ඇතුළත් වීම.

(ii) අදාළ කමිටුව විසින් වාහන මිල නිරන්තරයෙන් වෙනස් කිරීම්වලට භාජනය කිරීම හා මිල කමිටුව ඉදිරිපත් කරන වටිනාකම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ වෙනත් ස්වාධීන පාර්ශවයක් විසින් හෝ නැවත ඇගයීමකට ලක් නොකිරීම.

(iii) ගැසට් නිවේදනය ප්‍රකාරව නිෂ්පාදකයාගේ මිල හෝ වෙළඳපල වටිනාකම යන දෙකෙන් වැඩි වටිනාකම මත වාහනයේ බදු වටිනාකම තීරණය නොකිරීම.

(iv) වාහන ආනයනය කරන ඒජන්තවරුන්ගේ ඉල්ලීම මත ඉදිරිපත් කළ වටිනාකම අඩු කිරීම හා ආනයනකරුවන්ට වඩා වාසි සහගතවන ලෙස වාහන මිල තීරණය කිරීම.

(v) උප මාදිලි කීපයකින් සමන්විත වාහන සඳහා වටිනාකම අඩුම මාදිලියේ මිල රේගු බදු වටිනාකම ලෙස තීරණය කිරීම හා උප මාදිලියන් සඳහා වෙන් වෙන්ව මිල නියම නොකිරීම.

(vi) නිෂ්පාදකයාගේ මිල මත අසාමාන්‍ය ලෙස වට්ටම් අඩුකර මිල තීරණය කිරීම.

(vii) වාහනයක රේගු බදු වටිනාකම තීරණය කිරීමේදී එම වාහන මාදිලිවල විදේශ වෙළඳපලේ හුවමාරුවන වටිනාකම් පිළිබඳව රේගු මිල කමිටුව අවධානය යොමු නොකිරීම.

(viii) ආනයනය කරනු ලබන වාහන පිළිබඳ සමීක්ෂණය සිදු නොකිරීම.

(ix) විදේශ විනිමය අනුපාතයන්ගේ වෙනස්වීම් මත වාහන තක්සේරු වටිනාකමට වන බලපෑම සැලකිල්ලට ගෙන අවශ්‍ය මිල සංශෝධනයන් සිදු නොකිරීම.

(ඉ) 2015 අප්‍රේල් 25 දිනැති අංක 1526 දරන රේගු සටහන්කරය මගින් ආනයනය කරන ලද වාහනයක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට යාමේදී එය පාවිච්චි කළ රථයක් බව නිරීක්ෂණය කර තිබුණු අතර ඒ පිළිබඳව තහවුරු කර එවන ලෙස ශ්‍රී ලංකා රේගුවේ මෝටර් රථ අංශයට දන්වා තිබුණි. පසුව රේගු මෝටර් රථ අංශය විසින් එම රථය පාවිච්චි නොකළ වාහනයක් බවට තහවුරු යවා තිබූ නමුත් එම රථය එක්සත් රාජධානියේදී අංක YH14VCZ යටතේ ලියාපදිංචි කර පසුව ශ්‍රී ලංකාවට ආනයනය කර තිබුණු එකක් බව

නිරීක්ෂණය විය. ඒ අනුව බදු කටයුතු සඳහා ශ්‍රී ලංකා රේගුවේ භාණ්ඩ පරීක්ෂා කිරීමේ ක්‍රියාවලීන් විධිමත්ව සිදු නොවන බව නිරීක්ෂණය විය.

(ඊ) 2012 මාර්තු 30 දිනැති අංක 1751/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද නිවේදනය මගින් රේගු සංයෝජිත අංක 8707.10 යටතේ ආනයනය කරනු ලබන වාහන බද (Body Shell) කොටසක් සඳහා අයකළ යුතු රේගු බදු ප්‍රමාණය ආනයනික මි.ර.ගැ. (CIF) වටිනාකමින් සියයට 15 ක වටිනාකම හෝ ඒකකයක් සඳහා රු.291,000 ක් යන වටිනාකම් දෙක අතුරින් වැඩි වටිනාකම රේගු බදු ලෙස අයකිරීමට නියම කර තිබුණි. එහෙත් ආනයනික එවැනි වාහන බද කොටස් 2032 ක් සඳහා වැඩි බදු වටිනාකම රේගුව විසින් අයකර නොගැනීම හේතුවෙන් රු.566,901,545 කට ආසන්න බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි.

(උ) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ විවිධ හේතූන් මත සාමාන්‍ය බදු ගෙවීමේ ක්‍රමවේදයෙන් බැහැරව නිදහස් කරනු ලබන අවස්ථාවලදී ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලැසීම හා අධීක්ෂණ කටයුතු කිරීම ශ්‍රී ලංකා රේගුවේ D අංශය මගින් සිදු කරනු ලැබේ. එම අංශයේ පහත සඳහන් අභ්‍යන්තර පාලන දුර්වලතා නිරීක්ෂණය විය.

(i) 2014 වර්ෂයේ සිට අංශයේ කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබීම.

(ii) ආනයනකරුවන් ඉදිරිපත් කරන බැංකු ඇපකර හා සමාගම් ඇපකර ලියාපදිංචිය හා අධීක්ෂණ කටයුතු දුර්වල මට්ටමක පැවතීම.

(iii) බැංකු ඇපකර හා සමාගම් ඇපකර සම්බන්ධයෙන් වූ තොරතුරු ආසිකුඩා පරිගණක පද්ධතිය තුළ ඇතුළත්ව නොතිබීම හේතුවෙන් අදාළ ලේඛනවල නිරවුල් කර තිබූ බවට ව්‍යාජ සටහන් ඇතුළත් කර බදු ගෙවීම පැහැර හැරීමේ ඉඩකඩ පැවතීම.

(iv) තිරිඟු, සිමෙන්ති, ඛණිජ තෙල් වැනි තොග (Bulk Cargo) වශයෙන් සිදු කරන ආනයනයන් සම්බන්ධව ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැති වීම.

(v) ශ්‍රී ලංකා රේගුවේ D අංශය විසින් පවත්වාගෙන යනු ලබන පොත්පත් හා ලේඛන විද්‍යාත්මක හා තාක්ෂණානුකූලව වෙන්කර පවත්වා ගෙන නොමැති අතර ඒවා සැලසුම් කිරීම, මෙහෙයවීම, අධීක්ෂණය හා පාලනය දුර්වල මට්ටමක පැවතීම.

(vi) එම අංශයේ පැමිණීමේ හා පිටවීමේ ලේඛනය අතිකාල ලේඛනය සහ නිවාඩු ලේඛනය සම්බන්ධයෙන් පාලනමය දුර්වලතා පැවතීම.

(ඌ) රේගු බදු හා ගාස්තු වශයෙන් රු.මිලියන 17 කට අධික මුදලක් ගෙවිය යුතු භාණ්ඩ ඇතුළත් බහාලුමක් සඳහා ආනයනකරුවකු විසින් බදු වශයෙන් රු.549,622 ක් පමණක් ගෙවා නිදහස්කර ගැනීමට කටයුතු කර තිබුණි. පසුව එම බහාළුම විශේෂ කාර්ය බලකාය විසින් රේගු පරිශ්‍රයෙන් බැහැර ස්ථානයකදී අත්අඩංගුවට ගැනීමට කටයුතු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අදාල බහාලුම 2016 ජනවාරි 15 දින ශ්‍රී ලංකාවට ආනයනය කර තිබුණු අතර ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට දින 09 කට පෙර එම බහාළුම පිළිබඳව රේගු විමර්ශනයක් ආරම්භ කිරීමට ශ්‍රී ලංකා රේගුවේ ආදායම් අධීක්ෂණ අංශය කටයුතු කර තිබුණි. පසුව ආනයනකරු විසින් ඉදිරිපත් කර තිබූ අභියාචනයක් පදනම් කරගෙන වැඩිදුර පරීක්ෂාවකින් තොරව රේගු විමර්ශනය අවසන් කිරීමට කටයුතු කර තිබුණි.

(ii) නිෂ්කාශන අංශයේ ලේඛන පරීක්ෂාවෙන් අනතුරුව අදාළ බහාලුම ඔරුගොඩවත්ත ග්‍රේ ලයින් I අංගනය වෙත යොමු කර තිබුණද, කිසිදු භෞතික පරීක්ෂාවකින් තොරව නිදහස් කිරීමට රේගු නිලධාරීන් කටයුතු කර තිබුණි.

(iii) විශාල රේගු බදු වංචාවක් සිදු කිරීමට ආනයනකරු වෙත අවස්ථාව සලසා දීම සම්බන්ධයෙන් අදාළ රේගු නිලධාරීන්ට විරුද්ධව රේගු ආඥා පනතේ 137 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි.

(එ) භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ අංක 1006 යටතේ ආනයනික සහල් කි.ග්‍රෑ. 01 ක් සඳහා අයකරමින් පැවති රුපියලක (රු.1) විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉවත් කර 2015 ජනවාරි 22 දින රු.20 ක්ද, 2015 මාර්තු 25 දින රු.40 ක්ද, වශයෙන් විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවා තිබුණි. එලෙස බදු අනුපාතයන් වැඩි කර තිබියදීත් 2015 ජනවාරි 22 දින රුපියලක බද්ද පමණක් ආනයනකරුවන් 10 දෙනෙකුගෙන් අයකර ගැනීමට රේගුව කටයුතු කිරීම හේතුවෙන් රු.23,104,000 ක බදු මුදලක් සහ 2015 මාර්තු 25 දින ආනයනකරුවන් දෙදෙනෙකුගෙන් රු.20 ක බද්දක් පමණක් අයකිරීමත් හේතුවෙන් රු.55,296,000 ක බදු ආදායමක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. මේ හේතුවෙන් විශේෂ වෙළඳ භාණ්ඩ බදු ලෙස අයවිය යුතු රු.79,440,000 ක් පමණ වූ රජයේ බදු ආදායමක් බාහිර පාර්ශවයන් අත රැඳී පවතින බවත් එම හිඟ ආදායම් කඩිනමින් රැස් කර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත් නිරීක්ෂණය විය.

(ඒ) 2015 පෙබරවාරි 24 දින පුද්ගලික ආයතනයක් විසින් සහල් කි.ග්‍රෑ.52,000 ක් ආනයනය කර තිබූ අතර ඒ සඳහා රු.1,040,000 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් ගෙවිය යුතුව තිබුණි. එම බදු මුදල් අය නොකර බැංකු ඇපකරයක් මත සහල් තොගය නිදහස් කර ගැනීමට අවස්ථාව ලබාදී තිබුණි.

(ඔ) ශ්‍රී ලංකා රේගුව තුළ සිදු කරනු ලබන රේගු විමර්ශන මගින් අත්අඩංගුවට ගෙන රාජසන්තක කරනු ලබන භාණ්ඩ ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරණ අංශය විසින් ටෙන්ඩර් කැඳවීම හා ප්‍රසිද්ධ වෙන්දේසිය මගින් විකිණීමට කටයුතු කිරීම වර්තමාන ක්‍රියාවලිය වේ. සමාලෝචිත වර්ෂයේ එසේ විකුණා තිබූ භාණ්ඩ වෙනුවෙන් අවස්ථා 45 කදී රු.546,608,735 ක මුදලක් එකතුකර තිබුණි. මෙම විකිණීමේ ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් 1984 මාර්තු 30 දිනැති අංක 291 දරන ගැසට් නිවේදනය අනුව නිකුත් කර ඇති අංක PL 46 දරන අභ්‍යන්තර චක්‍රලේඛය මගින් උපදෙස් ලබා දී තිබුණද, භාණ්ඩ විකිණීමේ ක්‍රියාවලිය විධිමත්ව හා විනිවිදභාවයකින් යුතුව ක්‍රියාත්මක නොවන බව ඉකුත් වර්ෂයට අදාළ විගණකාධිපති වාර්තා සහ විගණන විමසුම්වලින් පෙන්වා දී තිබුණි. එම අඩුපාඩු 2016 අප්‍රේල් 30 දින වන විටත් නිවැරදි කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදීද තවදුරටත් නිරීක්ෂණය වූ අඩුපාඩු කිහිපයක් පහත දැක්වේ.

(i) සිදුකරනු ලබන විකුණුම්වලදී තෝරාගත් ගැණුම්කරුවන්ගෙන් අදාළ ගැණුම් මිලෙන් සියයට 50 ක මුදල් තැන්පතුවක් ලබා ගත යුතු අතර ප්‍රසිද්ධ වෙන්දේසිවලදී අදාළ දිනය තුළදීම විකුණුම් මිලෙන් සියයට 10 ක තැන්පතුවක් ලබා ගත යුතු විය. එහෙත් 2015 වර්ෂයේදී සිදුකර තිබුණු විකුණුම් අවස්ථා 45කදී එකතු කළ රු.546,608,735 ක විකුණුම් සම්බන්ධයෙන් මෙම විධිවිධාන අනුගමනය කර නොතිබුණි.

(ii) විධිවිධාන ප්‍රකාරව සෑම විකුණුමක්ම අනුමත කළ දින සිට දින 03 ක් ඇතුළත සම්පූර්ණ මුදල් ගෙවීමට ගැණුම්කරු අපොහොසත් වුවහොත් අදාල තැන්පතු මුදල රාජසන්තක කළ යුතු වුවද, භාණ්ඩ විෂයයන් 13 ක් සම්බන්ධයෙන් ඉවත්කර ගැනීම සඳහා දින 46 ක සිට දින 167 ක් දක්වා කාලයක් ලබා දී තිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(iii) ඉතා ඉහළ විකුණුම් වටිනාකමක් ඇති භාණ්ඩ සඳහා උපරිම වශයෙන් රු.100,000 ක ආපසු ගෙවන තැන්පතුවක් තීරණය කිරීම හේතුවෙන් එම තැන්පතු මුදල රාජසන්තකවීමට ඉඩහැර අදාළ භාණ්ඩවල තක්සේරු වටිනාකම අඩුකර ගැනීමට කටයුතු කර තිබූ අවස්ථා 92 ක් විගණනයට නිරීක්ෂණය විය. මෙහිදී රාජසන්තක කළ තැන්පතු වටිනාකම රු.3,800,000 ක් වූ අතර රාජසන්තක කළ තැන්පතු මුදලට වඩා රු.22,152,347 කින් භාණ්ඩවල තක්සේරු මිල අඩුකර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඕ) 2014 ජනවාරි 02 දින පැවති ආපනශාලා කමිටු රැස්වීමේදී දෙවන ලංසුවේ සිට ජලය, විදුලිය සහ ආපන ශාලා පරිශ්‍රය සඳහා මිලක් ඇතුළත් කරන ලෙසට ආපන ශාලා කමිටුව සේවා සැපයුම් අධ්‍යක්ෂට දැනුම් දී තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ක) විදේශ වැඩමුළුවලට සහභාගී වූ නිලධාරීන් තිදෙනෙකු සඳහා එම විදේශ ගතවූ කාලපරිච්ඡේදයට අදාළ දින වෙනුවෙන්ද රු.13,807 ක අතිකාල ගෙවා තිබුණි.

**3.20 මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**---------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 341 | 320 | 21 | - |
| (ii) | තෘතියික මට්ටම | 1,152 | 757 | 395 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 979 | 610 | 369 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 488 | 326 | 177 | 15 |
| | **එකතුව** | **2,960** | **2,013** | **962** | **15** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රේගුවේ අනුමත සේවක සංඛ්‍යාව 2,960 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 2,013 ක් විය. ඒ තුළ වූ ඍජුවම රේගු කටයුතු හා සම්බන්ධව නිලධාරීන් සංඛ්‍යාව ආසන්න වශයෙන් 1,077 ක් පමණ විය.

(ආ) ආනයනික භාණ්ඩ මගින් රාජ්‍ය ආදායමට සැලකිය යුතු දායකත්වයක් සිදු කරනු ලබන බැවින්, ශ්‍රී ලංකා රේගුව විසින් ආනයනික භාණ්ඩ ඇතුළත් බහාළුම් පරීක්ෂා කිරීමේ කටයුතු සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් යෙදිය යුතුව තිබුණි. ආනයනකරුවන් විසින් ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා බදු මුදල් නිවැරදිව ගෙවීම සිදු කර තිබුණු බව තහවුරු කර ගැනීමට ආනයනික භාණ්ඩ ඇතුළත් බහාළුම් පරීක්ෂාව ශ්‍රී ලංකා රේගුවේ ප්‍රමුඛ කාර්යයක්ව පැවතුණි. මේ පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී 2015 වර්ෂයේදී ආනයනික භාණ්ඩ ඇතුළත් බහාළුම් 309,947 ක් පරීක්ෂාවට ලක් කර තිබූ ඔරුගොඩවත්ත බහාළුම් පරීක්ෂණ මධ්‍යස්ථානයට එම කටයුතු සඳහා නිලධාරීන් 29 දෙනෙක් පමණක් යොදවා තිබුණි. ඒ අනුව එක් නිලධාරියෙකු විසින් දිනකට පරීක්ෂා කළ යුතු බහාළුම් සංඛ්‍යාව 29 ක් පමණ වන අතර එය ප්‍රායෝගිකව සිදු කළ නොහැකි කාර්යයක් වන හෙයින් ශ්‍රී ලංකා රේගුවේ බහාළුම් පරීක්ෂණ කටයුතු විධිමත්ව සිදු කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය ආදායමට සැලකිය යුතු දායකත්වයක් නොලැබෙන ඇතැම් අංශ සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩල සංඛ්‍යාවකට වැඩි කාර්ය මණ්ඩලයක් යොදවා තිබූ අවස්ථා නිරීක්ෂණය විය. ඒ අනුව මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපලෙහි 2015 වර්ෂයේ සමස්ථ ආදායම රු.140,713 ක්ව තිබියදී එහි රේගු කටයුතු සඳහා නිලධාරීන් 15 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. තවද,

ශ්‍රී ලංකා රේගුවේ නිවාරණ කාර්යාලවල රාජකාරි සඳහා නිලධාරීන් 614 ක් අනුයුක්ත කර තිබුණද, එක් එක් නිවාරණ කාර්යාලවල සේවයේ නියුතු නිලධාරීන්ගේ රාජකාරීන් කුමක්ද යන්න ශ්‍රී ලංකා රේගුව විසින් හඳුනාගෙන නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රේගුවේ එක් එක් අංශ වෙත අනුයුක්ත කර තිබුණු නිලධාරීන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලේඛනයක් මානව සම්පත් කළමනාකරණ අංශය විසින් හෝ පාලන අංශය පවත්වා නොතිබුණු බැවින් ඒ ඒ අංශවල අවශ්‍යතාවයන්ට අනුකූලවන අයුරින් නිලධාරීන් අනුයුක්ත කර තිබුණු බව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.